# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,761 — 1963 සැප්තැම්බර් 20 වැනි සිකුරාදා — 1963.9.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකම වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම :— | |
| ප්‍රාරම්භක දැන්වීම ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... | — |
| දකුණු පළාත ... ... ... | — |
| උතුරු පළාත ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... | — |
| වයඹ පළාත ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... | — |
| ඌව පළාත ... ... ... | — |
| සබරගමු පළාත ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... ... | 571 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... ... | 578 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... ... | 578 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... ... | — |

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1963නේ අංක 351 දරණ ආඥාව

යොමු අංකය : ජේ 61/62 එල් 80 වී.ඊ.—කිව්. සී. 158.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට, නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1963 අගෝස්තු 24 දින.

#### උපලේඛනය

| I | II |
|---|---|
| ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | ඉඩමේ විස්තරය |
| කොළඹ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරියා. | ඒ. 5162 දරණ මූලික සැලැස්මේ අංක 1 සහ 2 දරණ ඉඩම් කැබලි. |

9–503—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

### විශේෂ නිවේදනයයි

1963 සැප්තැම්බර් 26 වැනි බ්‍රහස්පතින්දා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1963 සැප්තැම්බර් 27 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1963 සැප්තැම්බර් 21 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1963 සැප්තැම්බර් 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1963 අංක 350 දරණ ආඥාව

යොමු අංකය : ජේ 61/62 එල්. 601 විඊ / ඉට/2/238.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1963 අගෝස්තු 24 දින.

### උපලේඛනය

**I**

**ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**

ගාළු දිස්ත්‍රික්කයේ උප දිසාපති.

**II**

**ඉඩමේ විස්තරය**

1\. ගාළු දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම නැගෙනහිර ගම්පති වසම තුළ උඩුගම පිහිටි අක්කර 26 පමණ වන හෝමදොල වත්තෙන් පහත සඳහන් මායිම් තුළ ඇති කොටස :—

උතුරට : පිටඹිවිට වත්ත නොහොත් ලබුගොඩැල්ල වත්ත; නැගෙනහිරට : හෝමාදොල සහ එම ඉඩමේම කොටසක් ; දකුණට : එම ඉඩමේම කොටසක් ; බස්නාහිරට : ගාල්ල-හිනිදුම ප්‍රසිද්ධ පාර සහ ඇම්. එච්. පී. ප්‍රනේරිස් සහ සුවනේරිස් හිමිකම් කියන අසොලුවාගොඩවත්ත.

2\. ගාළු දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම නැගෙනහිර ගම්පති වසම තුළ උඩුගම පිහිටි අ. 1, රූ. 1, ප. 0 පමණ වන හෝමාදොල වත්තෙන් පහත සඳහන් මායිම් තුළ ඇති කොටස :—

උතුරට : පියදාස බොරලැස්ස හිමිකම් කියන ඉඩම ; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : රජය සතු අසොලුවා ගොඩකන්ද ; බස්නාහිරට : ගාල්ල-හිනිදුම ප්‍රසිද්ධ පාර.

3\. ගාළු දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම නැගෙනහිර ගම්පති වසම තුළ උඩුගම පිහිටි අ. 3, රූ. 1, ප. 0 පමණ වන හෝමදොල වත්තෙන් පහත සඳහන් මායිම් තුළ ඇති කොටස :—

උතුරට : රජය සතු අසොලුවාගොඩකන්ද ; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : එම ඉඩමේම කොටසක් ; බස්නාහිරට : ගාල්ල-හිනිදුම ප්‍රසිද්ධ පාර.

9–505—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ජේ 62/63 එල්ජී 98. / එල්. එච්/ඩී. 1234.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1963 අංක 370 දරණ ආඥාව

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1963 සැප්තැම්බර් මස 9 දින.

### උපලේඛනය

**I**

**ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා**

කළුතර දිස්ත්‍රික්කයේ, උප දිසාපති.

**II**

**ඉඩමේ විස්තරය**

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොට මුන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ ගොරකාන ගුම්මුලාදැනි වසමේ කෙසෙල් වත්ත සුළු නගර සභා වේ අංක 2 දරණ කොට්ඨාශයේ පිහිටි මල්වානගේ වත්ත, අඹගහවත්ත, ගෙදරවත්ත, කුරුගේවත්ත, තැරැදෙනිය, තන්ත්‍රීගේ වත්ත සහ උස්වත්ත නමැති ඉඩම් කොටස් 20කට මායිම් :—

**කැබලි නො. 1 මල්වානගේ වත්ත—ප්‍රමාණය පර්චස් 5 :**

උතුරට : ගොරකාන පටුමග නො. 2; නැගෙනහිරට : ගෙරාකාන පටුමග නො. 2 ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; බස්නාහිරට : කොළඹ-ගාල්ල පර.

**කැබලි නො. 2 මල්වානගේ වත්ත—ප්‍රමාණය පර්චස් 01.12 :**

උතුරට : ඒ. සේරසිංහ මහතාට අයත් ගාලු පාරේ වරිපනම් අංක 271 දරණ මල්වානගේ වත්තේ කොටසක් ; නැගෙනහිරට : ගොරකාන පටුමග නො. 2 ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : ඩබ්ලිව්. සුගතදාස අල්විස් මහතාට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස.

**කැබලි නො. 3 මල්වානගේ වත්ත—ප්‍රමාණය පර්චස් 00.11 :**

උතුරට : කේ. ජේ. ඩයස් මහතාට අයත් වරිපනම් අංක 1 දරණ ගෙදර වත්තේ කොටසක් ; නැගෙනහිරට : ගොරකාන පටුමග නො. 2 ; දකුණට : ඩබ්ලිව්. සුගතදස මහතාට අයත් ගාලු පාරේ වරිපනම් අංක 275 දරණ මල්වානගේ වත්ත ; බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

**කැබලි නො. 4 ගෙදර වත්ත—ප්‍රමාණය පර්චස් 00.50 :**

උතුරට : ඒ. සී. ජේ. ද අල්විස් මහතාට අයත් ගොරකාන ලේන් 2 හි වරිපනම් අංක 6 දරණ ගෙදර වත්තේ කොටසක් ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටසක් ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2.

**කැබලි නො. 5 ගෙදර වත්ත—ප්‍රමාණය පර්චස් 01.06 :**

උතුරට : ගොරකාන පටුමග නො. 2; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටසක් ; දකුණට : බී. පී. ගුණසේන මහතාට අයත් ගොරකාන ලේන් හි වරිපනම් අංක 4 දරණ ගෙදර වත්තේ කොටසක් ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2.

II

ඉඩමේ විස්තරය

කැබලි නො. 6 ගෙදර වත්ත—ප්‍රමාණය පර්චස් 00.87 :

උතුරට : මෙම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට : ආර්. ස්ටීවන් පෙරේරා මහතාට අයත් ගොරකාන ලේන් අංක 2 හි වරිපනම් අංක 3 දරණ ගෙදර වත්තේ කොටසක් ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : මෙම ඉඩමේම කොටසක්.

කැබලි නො. 7 ගෙදර වත්ත—ප්‍රමාණය පර්චස් 01.25 :

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : ගොරකාන පටුමග නො. 2 සිට ගෙදර වත්තේ අනිත් කොටස්වලට යාමට වෙන් වී ඇති අඩිපාර ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට කේ. ජේ. ඩයස් මහතාට අයත් ගොරකාන පටුමග නො. 2 ; වරිපනම් අංක 1 දරණ ගෙදර වත්තේ කොටසක්.

කැබලි නො. 8 අඹගහවත්ත—ප්‍රමාණය පර්චස් 01.80 :

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2 සිට ගෙදර වත්තේ අනෙක් කොටස්වලට යාමට වෙන් වී ඇති අඩි පාර.

කැබලි නො. 9 අඹගහවත්ත—ප්‍රමාණය පර්චස් 03.56 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : ඒ. බෙනී ඊබට් ද අල්විස් සහ තවත් අයට අයිති, ගොරකාන පටුමග නො. 2 හි වරිපනම් අංක 7, 6/1 සහ 6/2 දරණ කුරුගේ වත්තේ කොටසක් ; දකුණට : බී. පී. ගුණසේන මහතාට අයත් ගොරකාන නො. 2 හි වරිපනම් අංක 4 දරණ ගෙදර වත්තේ කොටසක් ; බස්නාහිරට : ඒ. සී. ජේ. ද අල්විස් මහතාට අයත් ඉඩම.

කැබලි නො. 10 ගෙදර වත්ත—ප්‍රමාණය පර්චස් 00.43 :

උතුරට : ඒ. සී. ජේ. ද අල්විස් මහතාට අයත් ගොරකාන පටුමග නො. 2 හි වරිපනම් අංක 6 දරණ ගෙදර වත්තේ කොටසක් ; නැගෙනහිරට : ඒ. බෙනී ඊබට් ද අල්විස් සහ තවත් අය හිමිකම් කියා සිටින ගොරකාන පටුමග නො. 2 හි වරිපනම් අංක 7, 6/1 සහ 6/2 දරණ කුරුගේ වත්තේ කොටසක් දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

කැබලි නො. 11 කුරුගේ වත්ත—ප්‍රමාණය පර්චස් 04.81 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; බස්නාහිරට : බී. පී. ගුණසේන මහතාට අයත් ගොරකාන පටුමග නො. 2 හි වරිපනම්

II

ඉඩමේ විස්තරය

අංක 4 දරණ ගෙදර වත්තේ කොටසක් සහ ඒ. සී. ජේ. ද අල්විස් මහතාට අයත් ගොරකාන පටුමග අංක 2 හි වරිපනම් අංක 6 දරණ ගෙදරවත්තේ කොටසක්.

කැබලි නො. 12 කුරුගේ වත්ත—ප්‍රමාණය පර්චස් 03.25 :

උතුරට : මෙම ඉඩමේම කොටසක් ; නැගෙනහිරට : ගොරකාන පටුමග නො. 2 ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2.

කැබලි නො. 13 කුරුගේ වත්ත—ප්‍රමාණය පර්චස් 01.50 :

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : වතුර බසිනා කානුව ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

කැබලි නො. 14 කුරුගේ වත්ත—ප්‍රමාණය පර්චස් 02.87 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : වතුර බසිනා කානුව ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2.

කැබලි නො. 15 තැරැ දෙනිය—ප්‍රමාණය පර්චස් 00.81 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : වතුර බසිනා කාණුව.

කැබලි නො. 16 තන්ත්‍රිගේ වත්ත—ප්‍රමාණය පර්චස් 10.34 :

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : ජේ. ඇම්. පෙරේරා මහතාට අයත් ගල් කණුව පාරේ වරිපනම් අංක 59 දරණ උස්වත්තේ කොටසක් ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : වතුර බසින කානුව.

කැබලි නො. 17 තන්ත්‍රිගේ වත්ත—ප්‍රමාණය පර්චස් 00.35 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : ජේ. ඇම්. පෙරේරා මහතාට අයත් ගල්කණුව පාරේ වරිපනම් අංක 59 දරණ උස්වත්තේ කොටසක් ; දකුණට : මෙම ඉඩමේම කොටසක් ; බස්නාහිරට : ගොරකාන ලේන් නො. 2.

කැබලි නො. 18 උස්වත්ත—ප්‍රමාණය පර්චස් 04.12 :

උතුරට : මෙම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : ජේ. ඇම්. පෙරේරා මහතාට අයත් මෙම ඉඩමේම නැගෙනහිර කොටසේ පිහිටි ගෙයි බස්නාහිර පැත්තේ බිත්තිය ; දකුණට : ගොරකාන පටුමග නො. 2 ; බස්නාහිරට : ජේ. ඇම්. පෙරේරා සහ තවත් අය අයිතිකම් කියන ගල්කණුව පාරේ වරිපනම් අංක 57 දරණ තන්ත්‍රීගේ වත්තේ කොටසක්.

II

**ඉඩමේ විස්තරය**

කැබලි නො. 19 උස්වත්ත—ප්‍රමාණය පර්චස් 01.50 :

උතුරට : ගොරකාන පටුමග නො. 2 ; නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; බස්නාහිරට : ජේ. ඇම්. පෙරේරා මහතාට අයත් ගල්කණුව පාරේ වරිපනම් අංක 57 දරණ තන්ත්‍රීගේ වත්තේ කොටසක්.

II

**ඉඩමේ විස්තරය**

කැබලි නො. 20 උස්වත්ත—ප්‍රමාණය පර්චස් 00.62 :

උතුරට : ගොරකාන පටුමග නො 2 ; නැගෙනහිරට : ගොරකාන පරත්ත පාර ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස ; බස්නාහිරට : ගොරකාන පටුමග නො. 2.

9–541—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව**

### 1963නේ අංක 372 දරන ආඥාව

යොමු අංකය : ජේ. 61/62 එල් 341 (වී. ඊ.)—කිව්. ඊ. 164.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා ඉඩ්‍ත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1963 සැප්තැම්බර් මස 9 දින.

**උපලේඛනය**

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති | (4) කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිළියන්දල ගමේ පිහිටි පොතුවිලේ ඔවිට නමැති අක්කර 1ක් පමණ විශාලකම් ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—<br>උතුරට : මැගී අමරසේකර මහත්මිය සහ ඇස්. චන්ද්‍රසිරි මහතා සහ තවත් අය අයිතිකම් කියන දියඹිවිට : නැගෙනහිරට : මැගී අමරසේකර මහත්මිය සහ ඇස්. චන්ද්‍රසිරි මහතා සහ තවත් අය අයිතිකම් කියන දියඹිවිට ; දකුණට : එච්. පද්මා ගුණසේකර මහත්මිය අයිතිකම් කියන කුලතුංග ඔවිට ; බස්නාහිරට : දෙපාවේල්ල. |

9–589—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධි විධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

(1) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ, පරගොඩ ගම්මුලාදෑනි කොටසේ කිතලවලාන ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 31.5ක් පමණවූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : කේ. ඒ. අගෝසිංඤෝ සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; නැගෙනහිරට : මීරිගම-නාල්ල ප්‍රසිද්ධ පාර ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; බස්නාහිරට : ඇම්. පී. කුලරත්න හිමිකම් කියන දෙල්ගහහේන නමැති ඉඩම.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ පරගොඩ ගම්මුලාදෑනි කොටසේ, කිතලවලාන ගමේ පිහිටි දෙල්ගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 23.5 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස හා කේ. ඒ. අගෝසිංඤෝ හිමිකම් කියන ඉඩම හා දැනට ඇති පාර ; නැගෙනහිරට : කේ. ඒ. සෝමපාල හිමිකම් කියන කෝන්ගහවත්ත නමැති ඉඩම ; බටහිරට : කේ. ඒ. ඩේවිඩ් පෙරේරා හිමිකම් කියන දෙල්ගහහේන ; දකුණට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

(3) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ, පරගොඩ ගම්මුලාදෑනි කොටසේ, කිතලවලාන ගමේ පිහිටි දෙල්ගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 9 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට හා දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ඇම්. පී. කුලරත්න හිමිකම් කියන දෙල්ගහහේන ; බටහිරට : ඇල්. ඇන්. ඒ. තෝමස් සිංඤෝ හිමිකම් කියන දෙල්ගහවත්ත.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොටසේ පරගොඩ ගම්මුලාදෑනි කොටසේ, කිතලවලාන ගමේ පිහිටි, දෙල්ගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 4 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට හා දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : කේ. ඒ. ඩේවිඩ් පෙරේරා හිමිකම් කියන දෙල්ගහහේන, බටහිරට : ඩී. ටී. සමරතුංග හිමිකම් කියන දෙල්ගහහේන.

(5) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොටසේ, පරගොඩ ගම්මුලාදෑනි කොටසේ, කිතලවලාන ගමේ පිහිටි දෙල්ගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් රූඩ් 1, පර්චස් 11.5ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස හා දැනට ඇති පාර ; නැගෙනහිරට : ඇල්. ඇන්. ඒ. තෝමස් හිමිකම් කියන දෙල්ගහහේන දකුණට : මෙම ඉඩමේ ඉතිරි කැබැල්ල ; බටහිරට : පී. හදිංඤ්ඤා පොල හිමිකම් කියන අක්කර දහඅට වත්ත.

(6) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොටසේ, පරගොඩ ගම්මුලාදෑනි කොටසේ කිතලවලාන ගමේ පිහිටි අක්කර දහඅට වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් රූඩ් 2, පර්චස් 36.5ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට හා දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ඩී. ටී. සමරතුංග හිමිකම් කියන දෙල්ගහහේන ; බටහිරට : රජයේ ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 62/63 එල් 59 (වීඊ) කපුඩී. 603.
1963.8.2 දින,
කොළඹ දීය.

9–665—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1. කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බෝතලේ ඉහල ගමේ පිහිටි කිරිවාන වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 24 ක් පමණවූ බිම් තීරයක් එයට මායිම් :—

උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට : රජයේ ඉඩම; දකුණට : ආර්. ඒ. දනියෙල් අප්පුහාමි සහ තවත් අය හිමිකම් කියන කුඹුරු; බස්නාහිරට : පී. ඒ. අබේසේකර හා තවත් අය හිමිකම් කියන මල්වානකන්ද වත්ත.

2. කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බෝතලේ ඉහල ගමේ පිහිටි මල්වානකන්ද වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 3.7ක් පමණවූ බිම් තීරයක්, එයට මායිම් :—

උතුරට : ආර්. ඒ. දනියෙල් අප්පුහාමි හා තවත් අය හිමිකම් කියන කිරිවානවත්ත; නැගෙනහිරට : ආර්. ඒ. දනියෙල් අප්පුහාමි හා තවත් අය හිමිකම් කියන කිරිවානවත්ත හා ආර්. ඒ. දනියෙල් අප්පුහාමි හා තවත් අය හිමිකම් කියන කුඹුරු; දකුණට : ගම්සභා පාර; බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 62/63 එල් 102 (වීථි) කිච්බී. 601.
1963 අගෝස්තු මස 13 වෙනි දින,
කොළඹ දී ය.

9–508—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධි විධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බලබෝව ගමේ පිහිටි වැරැල්ලහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 16×8ක් පමණ බිම් තීරයට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට : එච්. පී. පොඩියා සහ තවත් අය හිමිකම් කියන ලුණුමඩලගහහේන නමැති ඉඩම; දකුණට : බලබෝව හරස් පාර; බස්නාහිරට : කොරසේ-වල්පිටමුල්ල ප්‍රසිද්ධ පාර.

2. කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බලබෝව ගමේ පිහිටි ලුණුමඩලගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 241×3 පමණ බිම් තීරයට මායිම් :—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට හා දකුණට : දැනට ඇති අඩි පාර; බස්නාහිරට : එච්. පී. සිරියා හිමිකම් කියන වැරැල්ලහේන නමැති ඉඩම.

3. කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බලබෝව ගමේ පිහිටි ලුණුමඩලගහහේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 373×3 ක් පමණ බිම් තීරයට මායිම් :—

උතුරට : දැනට ඇති අඩි පාර; නැගෙනහිරට : එච්. පී. කිරිහොඳ සහ තවත් අයෙක් හිමිකම් කියන කුරුඳුගස්හේන නමැති ඉඩම; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට : දැනට ඇති අඩි පාර.

4. කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අළුත්කුරු කෝරලේ "බී" ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ බලබෝව ගමේ පිහිටි කුරුඳුගස්හේන නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 45×3ක් පමණ බිම් තීරයට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : දැනට ඇති අඩි පාර; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට : එච්. පී. පීටර් හා තවත් අයෙක් හිමිකම් කියන ලුණුමඩලගහහේන නමැති ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 62/63. ඇල්.ජී. 36 කුවුබී. 599
1963 අගෝස්තු මස 20 දින, කොළඹ දීය.

9–544—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය.

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

අංකය : කිච්.ඒ. 709.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූ. සැ. අංක. ඒ. 5048. පිහිටීම : පොල්පිතිමූකලාන සහ වල්පොල යන ගම්, රාගම පත්තුව, අළුත්කුරු කෝරලේ දකුණ, කොළඹ දිස්ත්‍රික්කය.

**කැබලි අංකය : 1.**

ඉඩමේ නම : ලේක් සයිඩ් වත්ත නොහොත් මූකලන් වත්ත; විස්තර : අවුරුදු 30කට වඩා වයස්වූ පොල්ගස් ඇති වත්තක්; අයිතිකම් කියන අය : (1) කේ. වී. ඊ. තිරිමාන්න මිය., රිලාඋල්ල, කඳාන, (2) ලෙස්ලි තිරිමාන්න මයා., රිලාඋල්ල, කඳාන, (3) ඕ. බී. එෆ්. තිරිමාන්න මයා., කඳාන, (4) ඒ. එස්. එල්. තිරිමාන්න මයා., කඳාන, (5) බ්‍රිජට් අයිරින් සිරියාවතී ද සිල්වා, 8, සාන්ත ආනා පාර, කුරණ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 25.

**කැබලි අංකය : 2.**

ඉඩමේ නම : ලේක් සයිඩ් වත්ත නොහොත් මූකලන් වත්ත; විස්තර : අවුරුදු 30කට වඩා වයස්වූ පොල්ගස් ඇති වත්තක්, පොල් අතු සෙවිලි වැසිකිලියක් ද, බැමි ළිඳක් ද, ටැන්කි දෙකක් ද, ලී ගේට්ටුවක් ද, වත්තට උඩින් අදින ලද විදුලි කම්බියක් ද, විදුලි සංඥා පුවරු දෙකක් ද, ඇතුළත්ය; අයිතිකම් කියන අය : (1) කේ. වී. ඊ. තිරිමාන්න මිය., රිලාඋල්ල, කඳාන, (2) ලෙස්ලි තිරිමාන්න මයා., රිලාඋල්ල, කඳාන, (3) ඕ. වී. එෆ්. තිරිමාන්න මයා., කඳාන, (4) ඒ. එස්. එල්. තිරිමාන්න මයා., කඳාන, (5) බ්‍රිජට් අයිරින් සිරියාවතී ද සිල්වා, 8, සාන්ත ආනා පාර, කුරණ; ප්‍රමාණය : අ. 25, රූ. 0, ප. 01.

**කැබලි අංකය : 3.**

ඉඩමේ නම : ලේක් සයිඩ් වත්ත නොහොත් මූකලන් වත්ත; විස්තර : අවු. 30කට වඩා වයස්වූ පොල්ගස් ඇති වත්තක්, බැමි උළුසෙවිලි ගෙයක්, තාවකාලික මඩුවක් සහ බැමිළිඳක් ඇතුළත්ය; අයිතිකම් කියන අය : (1) කේ. වී. ඊ. තිරිමාන්න මිය., රිලාඋල්ල, කඳාන, (2) ලෙස්ලි තිරිමාන්න මයා., රිලාඋල්ල, කඳාන, (3) ඕ. වී. එෆ්. තිරිමාන්න මයා., කඳාන (4) ඒ. එස්. එල්. තිරිමාන්න මයා., කඳාන, (5) බ්‍රිජට් අයිරින් සිරියාවතී ද සිල්වා, 8, සාන්ත ආනා පාර, කුරණ; ප්‍රමාණය : අ. 0. රූ. 2, ප. 04.

**එකතුව : අ. 26, රූ. 0, ප. 30.**

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ අයිතිය හා ඉඩම්වල වටිනාකම ඔප්පු කිරීමට ලියවිලිද රැගෙන 1963 ඔක්තෝබර් 24 වැනි දින පූ. භා. 11ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963ක්වූ ඔක්තෝබර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

වී. පී. ඒ. පෙරේරා,
ආණ්ඩුවේ අතිරේක දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 9 වැනි දින,
කොළඹ කච්චේරිය.

9–528—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, යටිහලගල ගම්මුලාදෑනි වසමේ, යටිහලගල උඩගම ගමේ පිහිටි මහතැන්න වත්තෙන් ප්‍රමාණයෙන් අ. 24, රූ. 1, ප. 36ක් පමණ වූ බංගලාමලේ, කාන්ගරහේන සහ රබර්මලේ නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කැබලි තුන:—

**බංගලාමලේ—අ. 10, රූ. 0, ප. 0ක් පමණ:**

උතුරට: යහලතැන්න ගම්මුන්ගේ කුඹුරු යාය සහ ඇල; නැගෙනහිරට: ඇල; දකුණට: මහතැන්න වත්තේ ලොට් 14 දරණ කොටස සහ ඇල; බටහිරට: ඇල.

**කාන්ගරහේන—අ. 10, රූ. 0, ප. 0ක් පමණ:**

උතුරට: මහතැන්න වත්තේ ලොට් 5 දරණ කොටස සහ යහල තැන්න ගම්මුන්ගේ ඉඩම්; නැගෙනහිරට: යටිහලගල ගම්මුන්ගේ කුඹුරු සහ ගොඩ ඉඩම්; දකුණට: යටිහලගල ගම්මුන්ගේ ගොඩ ඉඩම් සහ කුඹුරු සහ ලොට් 7 දරණ රබර් මලේ; බටහිරට: මහ තැන්න වත්තේ ලොට් 6 බී දරණ ඉඩම.

**රබර්මලේ—අ. 4, රූ. 1, ප. 36ක් පමණ:**

උතුරට: මහතැන්න වත්තේ ලොට් 6 දරණ කාන්ගරමලේ; නැගෙනහිරට: යටිහලගල ගම්මුන්ගේ ඉඩම්; දකුණට: යටිහල ගල ගම්මුන්ගේ ඉඩම්; බටහිරට: යටිහලගල ගම්මුන්ගේ කුඹුරු.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය: ජේ 58/59 එල් 877 (වීජ්) ඇල්ඩී/ඊ/27.
1963 අගෝස්තු මස 24 දින,
කොළඹ දීය.

9–604—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

සඳහන් අංකය: කපු. බී. 568.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සිතියම් අංක ඒ 5,160. වත්තෙමුල්ල ගම.

**කැබලි අංකය: 1.**

නම: පරගහලන්ද; විස්තර: අවුරුදු 20-30 වයස පොල්ගස් එකකින් යුත් පොල් ඉඩම; හිමිකම් කියන අය: රජය සතු—ගෝනාවිල, මාකඳුරේ ඒ. ජී. මැනිකේ බලයෙන් අල්ලාගෙන තිබේ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 20.9.

**කැබලි අංකය: 2.**

නම: පරගහලන්ද; විස්තර: ළිඳක්, අතු සෙවිලි කළ ගෙවල් 2ක් හා අවු 20-30 වයස පොල් සහිත පොල් ඉඩම; හිමිකම් කියන අය: ගෝනාවිල, මාකඳුරේ ඒ. ජී. මැනිකේ; ප්‍රමාණය: අ. 6, රූ. 3, ප. 28.5.

**කැබලි අංකය: 3.**

නම: අඩිපාර; විස්තර: අඩිපාර; හිමිකම් කියන අය: රජය සතු—ගෝනාවිල මාකඳුරේ ඒ. ජී. මැනිකේ බලයෙන් අල්ලාගෙන තිබේ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.2.

එකතුව: අ. 7, රූ. 0, ප. 19.6.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන් ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963 නොවැම්බර් 4 වැනි දින පූ. භා. 10ට කොළඹ කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963 ඔක්තෝබර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද මෙම ඉඩම් වලට තම තමන්ගේ ඇති අයිතිවාසිකම් ඔප්පුකර පෙන්වීමට තිබෙන ඔප්පුතිරප්පු හා වෙනත් ලියකියවිලිද මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

පී. පත්මනාදන්,
ආණ්ඩුවේ උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ කච්චේරිය.

9–570—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය: කපු. බී. 573.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:—

මූලික සිතියම් අංක ඒ. 5,133. කිඹුලපිටිය ගම.

**කැබලි අංකය: 1**

නම: හොරහේන; විස්තර: අවුරුදු 60-80 වයස කුරුඳු, අවුරුදු 5-10 වයස හොරගස් හා කජුගස්, අවුරුදු 15-30 වයස පොල්ගස් 185ක් හා අවු. 3ක් වයස පොල්ගස් 21කින් යුත් පොල් හා කුරුඳුවත්ත; හිමිකම් කියන අය: මීගමුවේ ලුවිස් පෙදෙසේ 159, ඒ. ඇන්. බී. ඒ. අබේසිංහ හා ඊ. ආර්. අබේසිංහ; ප්‍රමාණය: අ. 9, රූ. 3, ප. 31.3.

**කැබලි අංකය: 2**

නම: හොරහේන; විස්තර: අවුරුදු 60-80 වයස කුරුඳු සහිත පොල් වත්ත; හිමිකම් කියන අය: රජයසතු—මීගමුවේ ලුවිස් පෙදෙසේ 159 ඒ. ඇන්. බී. ඒ. අබේසිංහ හා ඊ. ආර්. අබේසිංහ යන අය බලයෙන් අල්ලාගෙන තිබේ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.4.

එකතුව: අ. 10, රූ. 0, ප. 01.7.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963 නොවැම්බර් 4 වැනි දින පූ. භා. 10.15 ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1963 ඔක්තෝබර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද මෙම ඉඩම් වලට තම තමන්ගේ අයිතිවාසිකම් ඔප්පුකර පෙන්වීමට තිබෙන ඔප්පු තිරප්පු හා වෙනත් ලියකියවිලිද මෙම විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

පී. පත්මනාදන්,
ආණ්ඩුවේ උප දිසාපති,
කොළඹ දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ කච්චේරිය.

9–568—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

කිච්.සී. 158.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මූ. සැ. අංක ඒ 5162; කැබලි අංක 1 සහ 2; බියගම, කොළඹ දිස්ත්‍රික්කය.

**කැබලි අංකය: 1.**

ඉඩමේ නම: කොළඹගේන; විස්තරය: අවුරුදු 20කට වැඩි රබර්, අවුරුදු 20ක් පමණවූ පොල් සහ රබර් මිශ්‍ර ගොවිතැන් සහ කුඹුර; අයිතිකරු: මොහමඩ් ලෙබ්බේ පතිමා උම්මා උව්විස් මිය., තැපැල් ස්ථානාධිපති බංගලාව, මල්වාන; ප්‍රමාණය: අ. 17, රූ. 3, ප. 38.

**කැබලි අංකය: 2.**

ඉඩමේ නම: අඩිපාර; විස්තරය:——; අයිතිකරු: රජය සහ මොහමඩ් ලෙබ්බේ පාතිමා උම්මා උවාවිස් මිය; තැපැල් ස්ථානාධිපති බංගලාව, මල්වාන; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.

**එකතුව: අ. 18, රූ. 0, ප. 08.**

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963 නොවැම්බර් 2 වැනි දින ඉඩමේ අයිතිය හා වන්දි මුදල් සම්බන්ධයෙන් ඔප්පු කිරීමට ලියවිලිද රැගෙන පූ. භා. 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963 ඔක්තෝබර් 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැදු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. රාජරත්නම්,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි තැන,
කොළඹ දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ කච්චේරිය.

9–606—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් ලබාගැනීමේ ආඥපනත (460 වෙනි වගන්තිය)

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්එච්/සී/53/63.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරන ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත වූ, 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ මූන්ගේන ගමේ පිහිටි බුබුලලන්ද වත්ත—මූ. සැ. නො. ඒ. 5153 කැබලි අංක 1.

**කැබලි අංක: 1.**

නම: බුබුලලන්ද වත්ත; විස්තරය: පොල් ඉඩමක්, අවු. 40-50 පොල් ගස් 213ක්, අවු. 35-45 රබර් ගස් 155ක්, අවු. 20-30 රබර් ගස් 21ක්, අවු. 15-25 වල්දෙල් ගස් 13ක්, අවු. 10-20 කජු ගස් 17, අවු. 10-40 කොස් ගස් 5ක්, අවු. 10-25 කොස් ගස් 3ක්, අවු. 25-35 අඹගස් 5ක්, අවු. 10-15 අඹ ගස් 3ක්, අවු. 15-25 ගොඩපර ගස් 2ක්.; හිමිකම් කියන අය: ඊ. ඒ. ජී. ද සිල්වා, 79/15, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7, සී. ද ඇස්. විජේරත්න, 2, මැරිනා ඇවනිව්, බාන්ස් පෙදෙස, කොළඹ 7, කාල් ද ඇස්. විජේරත්න, 73, ග්‍රැගරි පාර, කොළඹ 7; ප්‍රමාණය: අ. 27, රූ. 0, ප. 07.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963 නොවැම්බර් 13 වැනි දින පූ. භා. 10ට කළුතර දිසාපති කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963 නොවැම්බර් 5 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ආර්. පාස්කරලිංගම්,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1963 සැප්තැම්බර් මස 11 වැනි දින,
කළුතර කච්චේරිය.

9–567—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය: ඇල්ඒ. 3762.

## රජයට ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

### 33 වන වගන්තිය යටතේවූ දැන්වීමයි

පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති තැන්පත් පී. ජී. පුංචිහේවා වන මම, මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම රජයට අත් කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල වශයෙන් රුපියල් 150ක මුදලක් රජයට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වන වගන්තිය යටතේ පුත්තලම් රික්වෙස්ට් උසාවියට ගෙවා ඇති බව මෙයින් දන්වමි. එම මුදලට හිමි අයිතිවාසිකම් ඇති අය විසින් උසාවිය වෙත ඉල්ලුම්කර මුදල් ලබාගත යුතුය. මීට සම්බන්ධ පුත්තලම් රික්වෙස්ට් උසාවියේ නඩු නොම්මරය 16,726 වේ.

පී. ජී. පුංචිහේවා,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති.

1963 සැප්තැම්බර් මස 11 වැනි දින,
පුත්තලම් කච්චේරියේ දීය.

### උපලේඛනය

පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පොම්පරිප්පු පත්තුවේ කරතිව් ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, ප. 4.2 ක්වූ, අංක ඒ. 1,759 දරණ මූලික සැලැස්මේ කැබලි අංක 4, 5 සහ 6 වශයෙන් සවිස්තරව දක්වා ඇති, ආලම්විල්ලු වත්ත සහ කරත්ත පාර යන ඉඩම්.

9–621—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය: ඇල්ඒ. 3763.

## රජයට ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)

### 33 වන වගන්තිය යටතේ වූ දැන්වීමයි

පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති තැන්පත් පී. ජී. පුංචිහේවා වන මම, මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම රජයට අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල සහ එම වන්දි මුදලට නියමිත පොළිය වශයෙන් රුපියල් 2,028.26 මුදලක් රජයට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වන වගන්තිය යටතේ හලාවත දිස්ත්‍රික් උසාවියට ගෙවා ඇති බව මෙයින් දන්වමි. එම මුදලට හිමි අයිතිවාසිකම් ඇති අය විසින් උසාවිය වෙත ඉල්ලුම්කර මුදල් ලබාගත යුතුය. මීට සම්බන්ධ හලාවත දිස්ත්‍රික් උසාවියේ නඩු නොම්මරය 381/විශෙෂ වේ.

පී. ජී. පුංචිහේවා,
පුත්තලම් දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප දිසාපති.

1963 සැප්තැම්බර් මස 11 වැනි දින,
පුත්තලම් කච්චේචේරියේ දීය.

### උපලේඛනය

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, මැද පළාතේ, මානින්ගල සහ නාරවිල යන ගම්වල පිහිටි ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, ප. 13.6 ක්වූ අංක ඒ. 1,747 දරණ මූලික සැලැස්මේ අංක 1, 5, 7 සහ 9 වශයෙන් සවිස්තරව දක්වා ඇති තිඹිරිගහකුඹුර සහ ලෝලුගහකුඹුර නමැති බිම් කැබලි හතර.

9–620—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය : ඇල් ඩී/ඩී. 57.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පළිස්පත්තු බටහිර කෝරළේ, නාරම්පනාව-කරගස් තැන්න ගමේ පිහිටි ප්‍රමාණයෙන් අ. 5, රූ. 2, ප. 31.1 ක් පමණ ඇති, වත්තේගම, මාතලේ පාරේ පදිංචි, ජී. ඇල්. ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මිය, බී. ඇම්. ගුණවර්ධන මහත්මිය, ඩී. ජී. ජයසූරිය මහත්මිය, ඕ. ඇම්. නානායක්කාර මහත්මිය, ඇම් .ජී. ගුණවර්ධන මහතා, ඇස්. පී. ගුණවර්ධන මෙනෙවිය, යූ. ඇන්. ගුණවර්ධන මෙනෙවිය යන සියළු දෙනාම අයිතිකම් කියනු ලබන, මූලික සිතියම් අංක ඒ. 3,062 හි කැබෙලි අංක 1 වශයෙන් මැන විස්තර කර ඇති රවත්ඉදලගහමඩ වත්ත නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963.11.6 වැනි දින පූ. භා. 10 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963 ඔක්තෝබර් 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩමට ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියළුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණු සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඇන්. විජේවර්ධන,
ආණ්ඩුවේ දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 13 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–666—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

සඳහන් අංකය : ඇල් ඩී/ඩී. 90.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ අඹගමුව කෝරලයේ හැටන්-දික්ඔය සුළු නගර සභා සීමාව තුල, අංක 5 දරණ කඩවීදිය සහ ඩන්බාර් යන කොටසේ හැටන්හි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 0, පර්චස් 30.5ක්වූ මූලික සිතියම් අංක ඒ 3,049 දරණ පිඹුරේ කැබලි අංක 1 වශයෙන් මැණ විස්තර කර ඇති දැනට සීමාසහිත දික්ඔය තේ සමාගම, ඒජන්වරු සීමාසහිත ජෝර්ජ් ස්ටුවට් සහ සමාගම, තැ. පෙ. 151, කොළඹ යන අය විසින් අයිතිවාසිකම් කියනු ලබන ඩන්බාර් වත්ත " ඩන්බාරේ වරිපනම් අංක 59න් කොටසක් " නමැති ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1963. 10. 30 වැනි දින පූ. භා. 10ට මහනුවර දිසාපති කායාීලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1963. 10. 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද, මෙම ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ලියකියවිලි මේ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේ දී ඉදිරිපත් කල යුතුයි.

ඇන්. විජේවර්ධන,
ආණ්ඩුවේ දිසාපති,
මහනුවර දිස්ත්‍රික්කය.

1963 සැප්තැම්බර් මස 13 වැනි දින,
මහනුවර කච්චේරිය.

9–683—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

අංකය : 5/1/14/114—344/742.

### දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

මෙහි පහත විස්තර දැක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස කුරුණෑගල දිසාපති කායාීලයේ දී 1963 ඔක්තෝබර් මස 21 වෙනි දින, පූ. භා. 10 ට 1935 හේ අඩක 19 දරන ඉඩම් සංශ්‍රික කිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සැම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.

1963.9.20 දින,
කොළඹ දීය.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් ‍කොමසාරිස්තැන වෙනුවට.

### දීමට යන ඉඩමේ විස්තර

| ප්ලෑනේ අංකය හා ගම | | කැබෙල්ලේ අංකය | | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| අ.ග.සි. 1592 | ... | 23 | ... | ඇස්. ඩී. ඊ. ආර්. අර්සකුළ රත්න | 16 | 0 | 29 |
| අ.ග.සි. 1592 | ... | 25 | ... | ඊ. ජී. එළාරිස් අප්පුහාමි ... | 11 | 0 | 15 |
| අ.ග.සි. 1592 | ... | 28 | ... | ඩබ්ලිව්. ක්ලෝඩ ප්‍රනාන්දු... | 12 | 0 | 13 |
| අ.ග.සි. 1592 | ... | 27 | ... | ඩබ්ලිව්. ඇල්බට ප්‍රනාන්දු... | 12 | 0 | 21 |

9–504—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

යොමු අංකය : ඇල්.බී/108/63.

### ත්‍රිකුණාමලයේ නගරය පුළුල් කිරීමේ ව්‍යාපාරය

1963 මැයි මස 17 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකරන ලද ත්‍රිකුණාමලයේ නගරය පුළුල් කිරීමේ ව්‍යාපාරය පිළිබඳ ඉඩම් කච්චේරි දැන්වීම් වෙත මහජනයාගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. මෙම ව්‍යාපාරය යටතේ බිම් කට්ටි ලැබීමට සුදුස්සන් වශයෙන් තෝරා ගනු ලැබූ අයගේ නාම්ලේඛන ත්‍රිකුණාමලයේ කච්චේරියේ සහ නගරය හා කඩවත් කරවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කායාීලයේ මහජනයාට බැලීම් සඳහා තැන්පත් කර ඇත.

3. මෙම ලැයිස්තුවේ සඳහන් අයගේ තෝරා ගැනීමට විරුද්ධව හෝ විභාගය සඳහා පෙනී සිටි යම් ඉල්ලුම්කරුවකු නිෂ්ප්‍රභා කිරීමට විරුද්ධව හෝ, දැක්වීමට යම් කිසි හේතු වේනම් මෙම දැන්වීම ප්‍රසිද්ධ කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ඇම්. බී. සේනානායක,
ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1963 සැප්තැම්බර් මස 14 වන දින,
ත්‍රිකුණාමලයේ දිසාපති කායාීලයේදීය.

9–663—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

## පදිංචිය පිණිස රජයේ ඉඩම් බදු දීම—කුරුමන්කාඩු, වවුනියා දිස්ත්‍රික්කය

වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා දකුණු දෙමළ ආදායම් පාලක කොට්ඨාශයේ වවුනියා නගර සීමා තුල පිහිටි කුරුමන්කාඩුහි, එක් බිම් කට්ටියක් අක්කර කාලක් පමණ වූ, රජයේ ඉඩම් කැබලි, පදිංචිය සඳහා බදු දීම පිණිස කට්ටිකරුවන් තෝරාගැනීම් වස් 1963ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දින පූ. භා. 10 ට වවුනියා දිසාපති කායඝ්‍රලයේදී වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති විසින් (මින් ඉදිරියට දිසාපති යයි හඳුන්වන පාඨයෙන් මෙම ඉඩම් කච්චේරිය සඳහා දිසාපති විසින් බලය පවරන ලද සෑම නිලධාරියෙක්ම අදහස් කෙරේ) ඉඩම් කච්චේරියක් පවත්වනු ලැබේ.

2. මේ සඳහා ඉල්ලුම් පත්‍ර, වවුනියා දිසාපති කායඝ්‍රලයෙන් 1963.10.16 දින හෝ ඊට පෙර, එක ඉල්ලුම්පතකට රුපියල් දහයක් බැගින් තැන්පත් මුදලක් දිසාපති කායඝ්‍රලයේදී බැඳීමෙන්, ලබා ගත හැක. මේ හැර වෙන අන්දමේ ඉල්ලුම් පතක් බාර ගනු නො ලැබේ. දිසාපති තැන මෙම මුදල රාජසන්තක කිරීමට සුදුසු හේතු නොතිබේ නම් එසේ තැන්පත් කළ එම මුදල ඉඩම් කච්චේරියෙන් පසු නැවත ඉල්ලුම්කරුට ගෙවනු ලැබේ. මේ සඳහා එවන සෑම ඉල්ලුම් පතක්ම අඩංගු ලියුම් කවරෙහි මුදුන් කවරෙහි "කුරුමන් කාඩු ඉඩම් ඉල්ලුම් පත්‍ර" යන්න සඳහන් කර 1963 ඔක්තෝබර් මස 17 වැනි දින හෝ ඊට පෙර වවුනියා දිසාපති කායඝ්‍රලයට ලැබීමට සැලැස්විය යුතුයි.

සෑම ඉල්ලුම්කරුවෙක්ම ඉඩම් කච්චේරියේදී පෙනී සිටිය යුතුයි. නොවැලැක්විය හැකි කරුණක් නිසා එසේ කිරීමට බැරිවුව හොත් ඔහුගෙන් බලය ලත් නියෝජිතයෙකු ඉදිරිපත් කළ යුතුයි.

3. ඉල්ලුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) පුරවැසි පනතේ විග්‍රහ කර තිබෙන පරිදි ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) ඉල්ලුම්කරු හෝ ඔහුගේ/ඇගේ භාර්යාව/ස්වාමිපුරුෂයා හෝ ඔවුන්ගෙන් යැපෙන දරුවන් ලංකාවේ කිසිම තැනක පිහිටි ගෙයක අයිතිකරුවන් නොවිය යුතුයි.

(ඇ) වවුනියා නගර සීමාව තුල ප්‍රමාණයෙන් අක්කර කාලකට වැඩි ගෙවල් සෑදීමට හැකි බිම් කැබලි වල අයිතියක් නො තිබිය යුතුයි. (පළමු වශයෙන් කිසිම ඉඩමකට අයිතිවාසි කමක් නොමැති ඉල්ලුම්කරුවන් ගැන විශෙෂ සැලකීමක් දක්වන අතර, අක්කරයකට අඩු ඉඩම් හිමියන් ගැන ඉන් පසු සලකා බලනු ලැබේ.

(ඈ) ඉල්ලුම්කරුවන් වවුනියා දිස්ත්‍රික්කයේ උපන් අයවිය යුතු අතර අවුරුදු පහලොවක පමණ මෙම දිස්ත්‍රික්කයේ (පදිංචිය නිසාම නොවන) අයිතිවාසිකමක් හා රුපියල් 100 සිට 400 අතරේ මාසික ආදායමක් තිබිය යුතුයි (වවුනියාව සේවක කොට්ඨාශයේ ඉල්ලුම් කරුවන්ට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ).

4. වාර්ෂික බදු මුදල නියම කරණු ලබනුයේ ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට හතරක් වන සේය. තෝරාගත් බිම්කට්ටි කරුවන්ට ඒ බව දැන්වූ පසු දින දහයක් ඇතුලතදී ඔවුන් විසින් අවුරුද්දක බදු මුදල ගෙවිය යුතුයි.

5. තෝරාගත් බදුකරුවන් වෙනුවෙන් වෙන්කර ඇති බිම්කට්ටි බාරගන්නා ලෙසට නියම් කල විට එම දිනය සිට දින දහයක් ඇතුලතදී එම ඉඩම්වල භුක්තිය බාර ගත යුතුයි.

6. ඔහු විසින් දිසාපති නියම කල විට දින දහයක් ඇතුලත දී බදු ගිවිසුමකට බැඳිය යුතුයි. එසේ කිරීමට අතපසු කළහොත් හෝ ඉහත සඳහන් කොන්දේසි උල්ලංඝනය කළහොත් හෝ ඔහුගේ/ඇගේ බද්ද අවලංගු කිරීමට හා යම් මුදලක් ගෙවා ඇත්නම් එම මුදල රාජසන්තක කිරීමට ද දිසාපති තුමාට බලය ඇත.

7. සෑම බද්දකටම පහත සඳහන් කොන්දේසි, අනිකුත් ඒවාට අමතරව අන්තර්ගත වී ඇත :—

(අ) කාලය : අවුරුදු 99 යි.

(ආ) බදු මුදල : බද්දෙහි නියම කර තිබෙන ආකාරයට බදුකරු විසින් එහි සඳහන් බදු මුදල් ගෙවිය යුතුයි. සෑම අවුරුදු 30 කට වරක් බදු මුදල සංශෝධනය කරනු ලැබේ. මෙම සංශෝධනයේදී වාර්ෂික බදු මුදල ගෙවී ගිය අවුරුදු 30 තුල ගෙවන ලද බදු මුදලෙන් සියයට 50 ට වැඩි නොවිය යුතුයි.

(ඇ) බදුකරු විසින් ඉඩම ලබාගෙන අවුරුදු 2ක් ඇතුලත දී දිසාපති ප්‍රථමයෙන් පිලිගත් සැලැස්මෙන් හා නියමිතයන් අනුකූලවද, ගෘහ සහ නගර වර්ධන ආඥපනතේ විධිවිධාන අනුවද තමන්ගේ වියදමින් රු. 5,000 නොඅඩු වටිනාකමක් ඇති ගොඩනැගිල්ලක් ඉදිකළ යුතුයි.

(ඈ) බදුකරු විසින් ඉඩම පදිංචියට හැර වෙන යම් කිසිම කටයුත්තකට පාවිච්චි නොකල යුතුය.

(ඉ) ඉඩම් කොමසාරිස්ගෙන් ප්‍රථමයෙන් අවසර නොලබා අතුරු බද්දක් දීමට, තෑග්ගක් දීමට, උගස් කිරීමට හෝ වෙන යම් කිසිම නුසුදුස්සක් කිරීමට නැතහොත් බද්දේ අයිතිවාසිකම් ගැන ක්‍රියා කිරීමට කට්ටිකරුට බලයක් නැත.

(ඊ) කට්ටිකරු විසින් දිසාපති තැනගේ සතුටට හේතුවන පරිදි ඉඩම සහ ඉඩමේ තිබෙන ගොඩනැගිලි පිරිසිදුවත් අබලන් නොවී තිබීමටත් ක්‍රියා කළ යුතුයි.

(උ) බදුකරු විසින් බද්ද අවසානයේදී හෝ බද්ද අවසන් කිරීමට ප්‍රථමයෙන් කළ තීරණයකට පසුව, ඉඩමේ බුත්තියත් එහි ගොඩනැගිලි සහ ඒවාට අලුතෙන් සදා ඇති නවාංගයන් හොඳ තත්ත්වයෙන් දිසාපතිට බාරදිය යුතුයි. (පාවිච්චි කිරීම නිසා සිදුවන සාමාන්‍යය අබල දුබලතාවයනට ඉඩ දෙනු ලැබේ).

(ඌ) රජය විසින් ඉඩමේ ගොඩනැගිල්ලට හෝ වෙනයම් කුමන නවාංගයකට හෝ මොනයම් කරුණක් නිසාවත් වන්දි මුදල් ගෙවනු නොලැබේ.

8. බද්ද සම්බන්ධව වැඩි විස්තර ලබාගැනීමට දිසාපතිට ලියවිල්ලකින් දැන්විය යුතුයි.

පී. එච්. ප්‍රේමවර්ධන,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1963 ක්වූ සැප්තැම්බර් මස 13 වැනි දින,
වවුනියා දිසාපති කායඝ්‍රලයේදීය.

9–576—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

## මන්නාරම දිස්ත්‍රික්කයේ බාබර් සාප්පුවක් සඳහා අඩම්පන් හන්දියේ රජයේ ඉඩමක් බදු දීම

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් අංක 13,722 හා 63.8.9 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මින් අවලංගු කරමි. නිවැරදි නිවේදනය අංක 13,751 හා 63.9.6 දින දරණ ගැසට් පත්‍රයේ පලවී ඇත.

ඉ. ඔ. කෙ. ගා. ප්‍රනාන්දු,
මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති.

9–618—63.9.20 දින අංක 13,761 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.**

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි